# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1815 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 07/12/2024 පැය 0600

## මාධ්‍ය නිවේදනය

**01. පියා විසින් අවුරුදු 14 ක් වයසැති දියණිය ඝාතනය කර වල දැමීමේ සිද්ධියට අදාල වැඩිදුර වාර්ථාව - ගම්පහ පොලිස් ස්ථානය.**

2024.12.05 වන දින ගම්පහ පොලිස් වසමේ අකරවිට ප්‍රදේශයේ පදිංචිකාරියක විසින් පොලිස් ස්ථානයට තම වයස අවුරුදු 14 ක්වූ දියණිය අතුරුදහන්ව ඇති බවට ගම්පහ පොලිස් ස්ථානයට සිදු කරන ලද පැමිණිල්ලකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

පැමිණිලිකාර කාන්තාව තම දෙවන විවාහයේ ස්වාමිපුරුෂයා සහ දියණිය සමග මාකෙවිට ප්‍රදේශයේ ඉදි කරමින් පවතින වෙනත් අයෙකුට අයත් තෙමහල් නිවසක තාවකාලිකව පදිංචිව සිටින අතර, ඔහු පෙදරේරුවෙකු වශයෙන්ද, පැමිණිලිකාරිය ඒකල ප්‍රදේශයේ පුද්ගලික අංශයේද රැකියාවක් සිදු කරනු ලබයි.

2024.12.02 වන දින තම සැමියා සහ දියණිය නිවසේ සිටියදී කාන්තාව උදෑසන රැකියාවකට ගොස් රාත්‍රියේ නැවත නිවසට පැමිණ දියණිය නිවසේ නොසිටිම පිළිබඳ තම සැමියාගෙන් විමසීම් සිදු කර ඇත. එහිදී ඔහු විසින් තම දියණිය යහලුවෙකුගේ පවුලේ සාමාජිකයින් සමඟ විනෝද චාරිකාවක් ගොස් ඇති බවටත් එදින නොපැමිණෙන බව හා පසුදින පැමිණෙන බවට බිරිඳව දැනුවත් කර ඇත. දියණිය 2024.12.05 වන දින දක්වාම නිවසට නොපැමිණිම හේතුවෙන් දෙදෙනා අරවුල් ඇති කරගෙන ඇති බවත් පසුව පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර තම සැමියා දැරියගේ අතුරුදහන්වීම සම්බන්ධයෙන් සැක බවද ප්‍රකාශ කර ඇත. සිද්ධිය සම්බන්ධව විමර්ශනය සිදුකල පොලිස් නිලධාරීන් විසින් වයස අවුරුදු 42ක් වන පැමිණිලි කාරියගේ පුරුෂයා අත්අඩංගුවට ගෙන තව දුරටත් විමර්ශන සිදුකරන ලදී.

2024.12.02 වන දින බිරිඳ විසින් ඇයට අයත් තම සැමියා විසින් උකසට තබන ලද රන් මාලයක් නිදහස් කර ගැනීම සඳහා තම දියණියට මුදල් ලබා දී තම පියා සමඟ ගොස් එම රන් මාලය නිදහස් කර ගන්නා ලෙසට ප්‍රකාශ කර බිරිඳ තම රැකියා ස්ථානයට ගොස් ඇත. මොහු තදින් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවෙකු

බැවින් දියණියට රන් භාණ්ඩ ලබා ගැනීම සඳහා ලබා දී තිබූ මුදල් දියණියගෙන් ඉල්ලා ඇති අතර දියණිය විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් දියණියට පහරදී මුදල් පැහැරගෙන නිවසින් පිටව ගොස් ඇත.

පසුව නිවසට පැමිණි ඔහු දියණිය පහරකෑ ස්ථානයේම වැටී සිටි නිසා ඇය පරික්ෂා කිරීමේදී මියගොස් සිටි බැවින් දැරියගේ මෘත ශරීරය ඉටි කවරයක බහා ඉදිරි කරමින් පවතින නිවසේ වැසිකිළි වලකට දමා වසා දැමීමට කටයුතු කර ඇති බව විමර්ශන වලදී අනාවරණය වී ඇත. අනාවරණය කර ගත් තොරතුරු මත ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝග පරිදි වැසිකිළි වලේ වලදමා තිබූ දියණියගේ සිරුර ගොඩගෙන පශ්චාත් මරණ පරික්ෂණය සඳහා ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු 2024.12.06 වන දින ගම්පහ ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2024.12.16 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. සිද්ධිය සම්බන්ධයෙන් ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

## 02. මනුෂ්‍ය ඝාතනයක් - වාරියපොල පොලිස් වසම.

2024.12.05 වන දින රාත්‍රී කාලයේදී වාරියපොල පොලිස් වසමේ දික්වැහැර ප්‍රදේශයේදී පුද්ගලයෙකුට පොල්ලකින් පහරදී ඝාතනය කර ඇති බවට වාරියපොල පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 66 ක් වූ දෙමටළුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා සැකකරු එක්ව මත්පැන් පානය කර ඇති බවත් එම අවස්ථාවේ ඇතිවූ මුදල් අස්ථාන ගතවීමක් සම්බන්ධයෙන් වූ බහින්බස් වීමක් දුරදිග යාමෙන් සැකකරු විසින් පොල්ලකින් පහරදී මෙම ඝාතනය කර ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය පශ්චාත් මරණ පරික්ෂණයෙන් පසු ඥාතීන්ට භාරදී ඇත. වයස අවුරුදු 30ක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. ටී56 අවියක් හා විදේශීය රටක නිෂ්පාදිත රිවොල්වර අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුර.

2024.12.06 වන දින සවස් කාලයේ වැලිඔය පොලිස් වසමේ කිරිඉබ්බන්වැව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ටී56 අවියක් හා එම පතරොම් 08ක්ද, විදේශීය රටක නිෂ්පාදිත රිවොල්වර අවියක් හා එම පතරොම් 05ක්ද සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැලිඔය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන කිරිඉබ්බන්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැලිඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. දියේ ගිලී මියයාමක් - ඊච්චන්කුලම් පොලිස් වසම.

2024.12.06 වන දින දහවල් කාලයේ ඊච්චන්කුලම් පොලිස් වසමේ පේරාරු ජලාශයේ පිටවානේ ඇලේ මසුන් අල්ලමින් සිටි පුද්ගලයෙකු දියේ ගිලී ඇතුරුදහන්ව ඇති බවට ඊච්චන්කුලම් පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

පොලිසිය හා ප්‍රදේශවාසීන් එක්ව අතුරුදහන්වූ අයගේ මෘත ශරීරය ඇළ ඉවුර අයිනේ රැදී තිබියදී සොයාගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 28ක් වන තරණිකුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වව්නියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, ඊච්චන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. නීති විරෝධී ලෙස මෙරටට සිගරට් රැගෙන එන ලද සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකය.**

2024.12.07 වන අද දින අළුයම් කාලයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය කටුනායක ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **තීරුබදු රහිතව ඩුබායි රාජ්‍යයේ සිට මෙරටට රැගෙන එන ලද සිගරට් 20000 (කාටුන් 100) ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන අනුරාධපුරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. හෙරොයින් සහ අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුර.**

2024.12.06 වන දින සවස් කාලයේ වැලිඔය පොලිස් වසමේ ඇහැටුගස්වැව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 113 ක් හා අයිස් මත්ද්‍රව්‍ය 65 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැලිඔය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත්කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන ඇහැටුගස්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැලිඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.12.06 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය.**

2024.12.06 වන දින සවස් කාලයේ මටටක්කුලිය පොලිස් වසමේ සමිත්පුර ප්‍රදේශයේදී මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 710ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2024.12.06 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ කටුකුරුඳුවත්ත ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන මෝදර,මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මංගලගම පොලිස් ස්ථානය.**

2024.12.06 වන දින දහවල් කාලයේ මංගලගම පොලිස් වසමේ උන්නිච්චිය රක්ෂිත ප්‍රදේශයේදී මංගලගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන කොක්කඩිචෝල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මංගලගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. මාරක රිය අනතුරක් - බිංගිරිය පොලිස් වසම.**

2024.12.06 වන දින රාත්‍රී කාලයේ බිංගිරිය පොලිස් වසමේ කුලියාපිටිය බෝවත්ත මාර්ගයේ හීන්පන්නාව හන්දිය අසලදී කුලියාපිටිය දෙස සිට බෝවත්ත දෙසට ගමන් කල පාපැදියක් මාර්ගයේ දකුණු පසට හැරවීමට යාමේදී

පසුපසින් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පාපැදිකරු බිංගිරිය රෝහලට ඇතුළත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා හලාවත රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 78 ක් වූ පහල කඩිගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථයේ රියදුරුද තුවාල ලබා බිංගිරිය රෝහලේ ප්‍රතිකාර ලබන අතර බිංගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - දොඩන්ගොඩ පොලිස් වසම.

2024.12.06 වන දින රාත්‍රී කාලයේ දොඩන්ගොඩ පොලිස් වසමේ ගැටගහහේන නැහින්න මාර්ගයේ නැහින්න ප්‍රදේශයේදී ගැටගහහේන දෙස සිට නැහින්න දෙසට ධාවනය යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු නාගොඩ හා විල්පාත රෝහල් වලට ඇතුළත් කිරීමේදී දෙදෙනාම මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 37 හා 42 යන වයස්වල පසුවන නැහින්න හා නැබඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෘත ශරීරයන් නාගොඩ හා විල්පාත රෝහල් වල මෘත ශරීරාගාරවල තැන්පත් කර ඇති අතර දොඩන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**